# ආරාධනයයි!

## ජේ. ප්‍ර. මැතිඳා - සමරමු සැමදා



ජනාධිපති සම්මානලාභී ගත්කතුවරයකු වූද, අතුරුගිරිය ගම් කාර්යසභාවේ සභිකයකු වූද ප්‍රදේශයේ දූ දරුවන්ට බුද්ධි ප්‍රභවය ලබාදුන් කීර්තිමත් ගුරුවරයකු වූද අභාවප්‍රාප්ත, ජේ. ප්‍ර. ගුණසේකර මැතිඳුන්ගේ 25 වැනි අනුස්මරණ උත්සවය නිමිත්තෙන් මහජන රැස්වීමක් සහ පොත් ප්‍රදර්ශණයක්,

2013 ඔක්තෝබර් 13 ඉරු දින උදෑසන 8.30 සිට සවස 5.00 දක්වා හෝමාගම හබරකඩ රණාල පාරේ අංක 56 දරණ ස්ථානයේ පිහිටි ප්‍රබෝධ මන්දිරයේදී පවත්වනු ලැබේ.

මෙම වැඩසටහන පටන් ගැනීම සිදුවන්නේ, උදෑසන 8.30 ට ජල්තර විපුලඥාණ දහම් නිකේතනයාධිපති ධර්ම ග්‍රන්ථ සම්පාදක අළුත්ගම විපුලඥාණ ස්වාමීන්වහන්සේ ගේ මූලිකත්වයෙන් සමාරම්භනය වී ප්‍රදේශයේ සම්භාවනීය විද්වතුන් විසින් විවෘත කරනු ලබන පොත් ප්‍රදර්ශණයකිනි.
විවිධ විෂයයන් යටතේවූ දුලබ සෝවියට් රුසියානු පොත් සහිත මෙම ප්‍රදර්ශනයේදී - ළමා - සාහිත්‍ය - විද්‍යා - දේශපාලන සහ වෙනත් පොත් පහසු මිලට ලබා ගත හැකිය.

එදින සවස 3.00 ට ඇරඹෙන ගුණානුස්මරණ රැස්වීමේ මුලසුන හොබවන්නේ මුල්ලේගම සුගතනන්දනාරාම පුරාණ විහාරාධිපති සද්ධර්ම වාගීශ්වර ශාස්ත්‍ර විශාරද ශාස්ත්‍රවේදී පන්ඩිත අතුරුගිරියේ විමලවංශ ස්වාමීන්වහන්සේ යි.
ප්‍රධාන ආරාධිත දේශණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් මානව සම්පත් සංවර්ධන ජ්‍යෙෂ්ඨ අමාත්‍ය ගරු ඩිව්. ගුණසේකර මැතිඳුන් වන අතර සෙසු කථිකයන් වන්නේ ප්‍රවීන පුවත්පත් කලාවේදී පිනදාස ලොකුපිටිය මහතා, ලංකා සමසමාජ පක්ෂයේ ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිර්මල සුබිත හපුආරච්චි මහතා සහ ශ්‍රී. ල. කො. ප. මත්තේගොඩ ශාඛාවේ ලේකම් පී. ජී. සිරිසේන මහතා වේ.

මෙයට,

ලේකම්
ශ්‍රී.ල.කො.ප
හෝමාගම ශාඛාව

සැම් වික්‍රමනායක
ලේකම්
ශ්‍රී.ල.කො.ප - හෝමාගම ප්‍රාදේශිය සභාව